“මට පෙර සිටි සමූහයා අතරට තම සමූහයා අතරින් තමන්ගේ පිළිවෙත පිළිපදින තම නියෝගය අනුගමනය කරන සගයන් හා ගෝලයින් නොහිඳ අල්ලාහ් විසින් එවූ කිසිදු නබිවරයකු නොවීය

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “මට පෙර සිටි සමූහයා අතරට තම සමූහයා අතරින් තමන්ගේ පිළිවෙත පිළිපදින තම නියෝගය අනුගමනය කරන සගයන් හා ගෝලයින් නොහිඳ අල්ලාහ් විසින් එවූ කිසිදු නබිවරයකු නොවීය. අනතුරුව ඔවුන්ගෙන් පසු බොහෝ කඩකිරීම් සිදුවිය. ඔවුන් සිදු නොකරන දෑ ඔවුහු පවසති. ඔවුනට නියෝග නොකරන ලද දෑ ඔවුහු සිදු කරති. කවරෙකු තම අතින් ඔවුන් වළක්වන්නට පරිශ්රමය යෙදුවේ ද
ඔහු දේවත්වය විශ්වාස කරන්නෙකි. එමෙන්ම කවරෙකු තම හදවතින් ඔවුන් වළක්වන්නට
පරිශ්රමය යෙදුවේ ද ඔහු ද දේවත්වය විශ්වාස කරන්නෙකි. තවත් කවරෙකු තම දිවෙන්
(වචනයෙන්) ඔවුන් වළක්වන්නට පරිශ්රමය යෙදුවේද ඔහු ද දේවත්වය විශ්වාස කරන්නෙකි. ඉන් ඔබ්බට විශ්වාසයෙන් අබ ඇටයක් (තරම්) හෝ වෙනකක් නොමැත. [صحيح] [رواه مسلم]

'නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට පෙර විසූ සමූහයා අතරින් කිසියම් හෝ නබිවරයකු හෝ වේවා, ඔහුගේ සමාජය තුළ පිවිතුරු, ඔහුට සහය ඵල කළ, කැපවීමෙන් කටයුතු කළ අවංක, ඔහුගෙන් පසු පරිපාලනය නිවැරදිව ක්රියාත්මක කරන, ඔහුගේ පිළිවෙත අනුගමනය කරන, ඔහුගේ නියෝග පිළිපදින පිරිසකින් තොරව අල්ලාහ් කිසිදු නබිවරයකු එව්වේ නැත,' යැයි එතුමාණෝ පැවසූහ. පසුව එම පුරෝගාමී දැහැමියන්ගෙන් පසුව යහපත නැති පිරිසක් පැමිණෙනු ඇත. තමන් සිදු නො කරන දෑ ඔවුහු පවසති. තමන්ට නියෝග නොකරන ලද දෑ ඔවුහු සිදු කරති. කවරෙකු තම අතින් ඔවුන් සමග වෙහෙස වන්නේ ද ඔහු දේවත්වය විශ්වාස කරන්නෙකි. එමෙන්ම කවරෙකු තම දිවෙන් ඔවුන් සමග වෙහෙස වන්නේ ද ඔහු ද දේවත්වය විශ්වාස කරන්නෙකි. තවත කවරෙකු තම හදවතින් (වචනයෙන්) ඔවුන් වළක්වන්නට පරිශ්රමය යෙදුවේද ඔහු ද දේවත්වය විශ්වාස කරන්නෙකි. ඉන් පසුව විශ්වාසයෙන් අබ ඇටයක් (තරම්) හෝ නොමැත.

http://www.sunnah.global/hadeeth/si/show/3480